# ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයට අදාල ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවෙන් ලැබිය යුතු රු. 1,812,385 ක චිත්‍රපට කුලි දායකත්වය ආදායමක් ලෙස ගිණුම්ගත නොකර එය ණයහිමි ගිණුමකට බැර කර තිබුණි. තවද ණයහිමි ගිණුමේ නිරූපනය කරනු ලබන සමුච්චිත ආදායම වු රු. 10, 918,258 ක මුදල සමුච්චිත ආදායම් ණයගැති ගිණුමේ නිරූපනය වන රු. 18,851,444 සමඟ නොගැලපුණි.

#### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට නිෂ්පාදන ණය ශේෂය රු. 64,682,582 ක් වී තිබුණු අතර එම ශේෂයෙන් සියයට 99.8 ක් හෙවත් රු. 64,554,331 ක් වසර පහකට වැඩි කාලයක සට පැවත එමින් තිබුණි. 2012 වර්ෂය තුළදි චිත්‍රපටයක් විකිණීමෙන් ලැබුණු රු. 5,000,000 ක මුදල හැරුණු විට වෙනත් කිසදු ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි. එම චිත්‍රපටය සඳහා වු ණය මුදල වෙනුවෙන් අයකර ගත යුතු බවට ගිණුම් වල දක්වා තිබුණු රු. 3,933,662 ක් වූ පොලිය භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ගිණුම් වලින් ඉවත් කර තිබුණි. චිත්‍රපට නිෂ්පාදන ණය ශේෂයෙන් අය කර ගත නොහැකි බවට ඇස්තමේන්තු කර තිබු ණය ප්‍රමාණය රු. 60,739,558 ක් හෙවත් සියයට 94 ක් වී තිබුණි.

(ආ) අරමුදල පවත්වාගෙන යාම සඳහා දේශිය හා විදේශිය චිත්‍රපටවලින් චිත්‍රපට සංස්ථාවට අයවිය යුතු සංස්ථා භාරයෙන් සයයට 20 ක් අරමුදලට ලබාදෙන නමුත් 2012 දෙසැම්බර් 31 දිනට අරමුදලට ලැබිය යුතුව පැවැති චිත්‍රපට කුලි දායකත්වය රු. 18,851,444 ක් වී තිබුණි.

(ඇ) අළුත්වැඩියාව හා නවීකරණය සඳහා සිනමාශාලා 5ක් වෙත ලබා දී තිබුණු ණය මුදල් හා ඊට අදාල පොලී මුදලින් 2012 ජනවාරි 01 දින වන විට අයවිය යුතු ශේෂය රු. 14,710,994 ක් වී තිබුණි. එම ණය වෙනුවෙන් 2012 වර්ෂයේදී අරමුදලට ආපසු ලද මුදල රු. 2,068,596 ක් හෙවත් සියයට 14 ක් වී තිබුණි. එක් සිනමාශාලාවකින් කිසිදු ණය වාරිකයක් අයවී නොතිබුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් විෂය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

| | ගිණුමේ විස්තරය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ලැබිය යුතු චිත්‍රපට නිෂ්පාදන ආදායම් - ආරම්භක ශේෂය | 2,537,597 | ගෙවිය යුතු නිෂ්පාදන ගිණුමේ ආරම්භක ශේෂයට අදාල උපලේඛනය |
| (ආ) | ලැබිය යුතු චිත්‍රපට නිෂ්පාදන ආදායම් ගිණුමට හර කිරීම | 163,141 | 2009 වර්ෂයට අදාල වැරදි නිවැරදි කිරීමේ ජර්නල සටහනේ නිවැරදිතාව තහවුරු කර ගත හැකි සාක්ෂි |
| (ඇ) | ලැබිය යුතු චිත්‍රපට නිෂ්පාදන ආදායම් ගිණුමට බැර කිරීම | 15,463 | 2008 හා 2010 වර්ෂවල සටහන් ඉවත්කිරීමේ නිවැරදිතාව තහවුරු කර ගත හැකි සාක්ෂි |

## 1.2.5 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1996 ඔක්තෝබර් 24 දිනැති අංක 946/9 දරන චිත්‍රපට සංවර්ධන අරමුදල සම්බන්ධ ගැසට් පත්‍රය<br>නියෝග අංක 6 (ඇ) | ප්‍රදානය කළ ණය මුදල් ආපසු ගෙවීම ප්‍රමාද වන්නේ නම් ඒ සඳහා අයවිය යුතු අධිභාරයන් නිශ්චය කර අයකර ගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | මු . රෙ .71 (1) (අ) සහ 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සභාපති සහ අනෙකුත් නිලධාරීන් වෙනුවෙන් මාසිකව රු. 19,250 ක් වූ දීමනා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකගතාවය ලබා ගෙන භාණ්ඩාර නියෝජ්‍ය ලේකම්වරයාගේ පූර්ණ අධිකාර බලය ලබා නොගෙන ගෙවිය යුතු වියදමක්ලෙස ගිණුම් ගත කර තිබුණි. |
| (ඇ) | 2000 ජුනි 12 දිනැති අංක පීඑෆ් / පීඊ / 09 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2000 වර්ෂයේදී ආයෝජනය කර තිබුණු වටිනාකම රු. 2,000,000 ක් වු ස්ථාවර තැන්පතු හා 2012 වර්ෂයේදී ආයෝජනය කර තිබුණු රු.1,500,000 ක් වු රිපෝ තැන්පත් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 4,996,573 ක බදු පූර්ව අතිරික්තයක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ඌනතාවය රු. 3,628,437 ක් වූයෙන් බදු පූර්ව අතිරික්තයෙහි වැඩිවීම රු. 8,625,010 ක් හෙවත් සියයට 237 ක් විය. අනෙකුත් ආදායම් රු. 1,795,082 කින් වැඩිවීම හා බොල්ණය වෙන්කිරීම රු. 5,128,020 කින් අඩුවීම සමාලෝචිත වර්ෂයේ අතිරික්තය වැඩිවීම කෙරෙහි බලපා තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයේ ලාභයට ගැලපීම් නොකළ යුතු අවස්ථා 06 ක් මගින් රු. 4,028,000 ක් හර කිරීම හා රු. 1,874,142 ක් බැර කිරීම මගින් සමාලෝචිත වර්ෂයේ ලාභය රු. 2,153,858 කින් අධිගණනය කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

1994 අංක 1 දරන ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ නියෝග මාලාවේ අංක 4 දරන නියෝගය යටතේ (අ) සිට (ඕ) දක්වා වු සංවර්ධන අරමුදලේ කාර්යභාරයන්ගෙන් කිසිවක් 2012 වර්ෂය තුළදී ඉටුකරගෙන නොතිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අරමුදල විසින් නිෂ්පාදනය කර චිත්‍රපට සංස්ථාවට විකුණනු ලැබූ චිත්‍රපටයකින් 2005 වර්ෂයේ සිට අයවිය යුතුව පැවති රු. 3,547,454 ක මුදලක් චිත්‍රපට සංස්ථාවෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) සිනමාශාලාවක් සඳහා ලබා දී තිබුණු ණය හා ඒ සඳහා පොලී මුදල වන රු. 2,355,959 න් කිසිදු ණය වාරිකයක් හෝ පොලී මුදලක් ආපසු අය කර ගැනීමට අරමුදල කිසිදු නීතිමය පියවරක් නොගෙන මුළු වටිනාකම අය කර ගත නොහැකි ලෙස ඇස්තමේන්තු කර ණයගැති ශේෂයෙන් අඩුකර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. එකී ණය මුදල අදාල කාර්යන් සඳහා යොදාගෙනද නොතිබුණි.

(ඇ) ජාතික චිත්‍රපට සංස්ථාව විසින් ඉන්දියාවේ පෞද්ගලික රසායනාගාරයක් සමඟ එක්ව 2007 වර්ෂයේදී නැමති චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර මූලික වියදම් ලෙස රු. 200,000 ක් වැය කර නිෂ්පාදකයකු සොයා ගැනීමට නොහැකි වීම හේතුවෙන් නිෂ්පාදනය අතහැර දමා එය අරමුදලේ චිත්‍රපට තොගයට ඇතුළත් කර තිබුණි.

3.3 **නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

2008 වසරේ සිට ජංගම ගිණුමක රු. 268,533 ක මුදලක් අක්‍රියව පැවති බව නිරීක්ෂණය විය.

4. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

4.1 **සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක. පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 ජේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයද ඇතුලත් වන පරිදි සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණු අතර ඉදිරි වර්ෂ සඳහා පිළියෙල කිරීමට හෝ අවධානය යොමු කර නොතිබුණි.

4.2 **අභ්‍යන්තර විගණනය**

අරමුදලේ ගිණුම් කටයුත චිත්‍රපට සංස්ථා අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණනය කර නොතිබුණි.

4.3 **විගණන කමිටු**

විගණන කමිටු පිහිටුවා නොතිබුණි.

4.4 **අයවැය ලේඛනමය පාලනය**

අරමුදල සඳහා අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිවරයා වෙත වරින්වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ණය අයකර ගැනීම

(ආ) අධිභාර